ඌව පළාත් සභාව 2025 වර්ෂය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව පළාත් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි 29 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 මැයි 27 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවද ඌව පළාත් සභාවේ ආදායම් මුදල් පදනම මත ගිණුම්ගත කළ බව දක්වා තිබුණි. එසේ වුවද ආදායම් ගිණුම්ගත කිරීමේදී උපචිත පදනම හා මුදල් පදනම යන දෙකම භාවිතා කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 251,172,593 ක හිඟ ආදායමක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් යටතේ දක්වා තිබුණි. එමෙන්ම වාණිජ අත්තිකාරම් ගිණුම් 06 කට අදාළව උපයන ලද රු.15,643,853 ක ආදායම අඩුවෙන් ගිණුම් ගත කර තිබුණු අතර ඌව කළමනාකරණ සංවර්ධන ආයතනයේ සේවා සැපයීම් වෙනුවෙන් ලැබිය යුතු රු. 1,284,040 ක ආදායම මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. ඒ අනුව, ආදායම් මුදල් පදනම මත ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.268,100,486 ක ලැබිය යුතු ආදායමක් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ආදායම් හා වියදම් උපචිත පදනම අනුව ගිණුම් තැබීම සිදු කළ යුතු වුවද, පවතින ප්‍රායෝගික තත්වය මත ආදායම් මුදල් පදනම මත හා වියදම් උපචිත පදනම අනුව ගිණුම් තැබීම සිදු කර ඇති බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂය තුළදී දිවයිනට බලපෑ "දිට්වා" සුළි කුණාටු ආපදාව හේතුවෙන් ඌව පළාත් සභාවට අයත් දේපළ හා වත්කම් වලට සිදු වූ හානිය ආසන්න වශයෙන් රුපියල් මිලියන 20,612 ක් වන බවට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර තිබුණද, එම හානිය 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. මෙම හානිය පළාත් සභාවේ මුළු වත්කම් වලට සාපේක්ෂව සියයට 24 ක පමණ ප්‍රතිශතයක් ගන්නා බැවින් මෙවැනි විශාල හානියක් මූල්‍ය ප්‍රකාශන වලින් බැහැර කිරීම් මගින් දේපල, පිරියත හා උපකරණ ශේෂයන්හි සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොවන බව නිරීක්ෂණය විය.	සිදුවූ හානිය ආසන්න වශයෙන් රු. මිලියන 20,612 ක් වන බවට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර තිබුණද, නිශ්චිතව තක්සේරු කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකළ බව සහ 2026 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ගැලපුම් කරන බව.	කාලපරිච්ඡේදයට අදාළ හානි නිශ්චිතව තක්සේරු කර ගැලපීම් කරන තෙක් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළදී ටෙන්ඩර් කර විකුණන ලද වාහන 09 ක වටිනාකම ගිණුම්වලින් ඉවත් නොකිරීම හේතුවෙන් දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වාහන වටිනාකම රු. 41,624,210 කින් වැඩියෙන් දක්වා තිබුණි.	වෙන්දේසි කර විකුණන ලද වාහන වත්කම් ලේඛනවලින් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව.	වාර්ෂික ගිණුම් තුළ නිවැරදිව ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 03 ක වටිනාකම වූ රු. 61,850,000 ක් මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කර නොතිබුණි.	අතපසුවීමකින් ඇතුළත් කිරීමට නොහැකි වූ බවත් 2026 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව.	ආයතනය සතු සියලු වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මහියංගණය මූලික රෝහලට සමාලෝචිත වර්ෂය තුළදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 17,347,800 ක් වටිනා වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණ ශේෂයන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	අපේක්ෂා කළ පරිදි එම උපකරණවල වටිනාකම ගිණුම්ගත කිරීමට නොහැකි වූ බවත් 2026 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු වත්කම් අදාළ මූල්‍ය වර්ෂය තුළ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ඌව පළාත් සභාව සතු වාහන අවසන් වරට, 2017 ජනවාරි 01 දින ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර මේ වන විට වසර 09 ක් ගතවී තිබුණ ද නැවත ප්‍රත්‍යාගණනය නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම් පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොවුණි.	2026 වර්ෂයේදී වාහන ප්‍රත්‍යාගණනය කිරීම සිදුකරන බව.	ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 7 හි 47 වන ඡේදය අනුව වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට ප්‍රත්‍යාගණයක් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	ඌව පළාත් සභා මුදල් රීති 509.1 ට අනුව වාණිජ අත්තිකාරම් ගිණුම් වලට අයත් ප්‍රාග්ධන වත්කම්වල වාර්ෂික ක්ෂය, ක්ෂය සංචිත අරමුදලට බැර කළ යුතු අතර ඌව පළාත් සභාව යටතේ ඇති වාණිජ අත්තිකාරම් ගිණුම් 06 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු. 30,550,812 ක් වුවද ක්ෂය සංචිතයට වර්ෂය තුල බැර කිරීම් රු. 56,526,895 ක් වූයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ක්ෂය සංචිත රු. 25,976,083 කින් වැඩියෙන් දක්වා තිබුණි.	ප්‍රමාද දෝශයකින් වාණිජ අත්තිකාරම් කටයුතු වල ලාභය ක්ෂය සංචිත අරමුදලට බැර වී ඇති බවත් 2026 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කරන බව.	වර්ෂයට අදාළ ක්ෂය, ක්ෂය සංචිත අරමුදලට නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා

වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 704 - ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් සහ ඉඩම් පිළිබඳ අමාත්‍යාංශය

(අ) වාණිජ අත්තිකාරම් ගිණුම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඌව පළාත් මුද්‍රණාලය නියමිත කාලය තුළ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට සියයට 03 දායක මුදල් නොගෙවීම මත රු.102,785 ක අධිභාර මුදලක් ගෙවා තිබුණ ද පළාත් මුදල් රීති 210.2 අනුව වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අධිභාර ගෙවීම කිසිදු නිලධාරියකුගේ වරදක් මත සිදු නොවූ බැවින් අදාළ අධිභාර මුදල මුද්‍රණාලයේ වියදමක් ලෙස සැලකිය යුතු බව.	පළාත් මුදල් රීති අනුව කටයුතු කළ යුතුය.

(ආ) වත්කම් ලේඛනගත නොකිරීම

ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, GEM ව්‍යාපෘතිය මගින් 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා මිලදී ගෙන පාසල් වෙත බෙදා හැර තිබුණු රු. 224,657,527 ක් වූ පරිගණක හා අනෙකුත් උපකරණ නිශ්චිතව හඳුනාගත හැකි පරිදි එම වත්කම් කේත අංක ක්‍රමයක් භාවිතා කර ලේඛන ගත කරමින් බෙදාහැර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා තිබුණු එම වත්කම් වල භෞතික පැවැත්ම සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	භාණ්ඩ හඳුනා ගැනීම සඳහා ස්ටිකරයක් හඳුන්වා දී එය ඇලවීමට කටයුතු කරන ලෙස ගබඩාභාර නිලධාරි වෙත මෙන්ම අදාළ භාණ්ඩ භාර ගන්නා සියලුම පාසල්හි විදුහල්පතිවරුන් වෙත උපදෙස් ලබා දී ඇති බව.	විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

ඌව පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ - 2024 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ රු. 3,546,397 ක වියදමක් දරා හකුරුගොල්ල අරාව පේෂ කර්මාන්ත ප්‍රවර්ධන ගොඩනැගිල්ල ඉදිකර තිබුණ ද 2025 නොවැම්බර් 25 වන විටත් ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණ සඳහා යොදාගෙන නොතිබුණි.	2024 ප්‍රතිපාදන මත ගොඩනැගිල්ල ඉදිකිරීම පමණක් සිදුකර ඇති බැවින් අනෙකුත් යටිතල පහසුකම් සපයාගෙන පවතින ගැටළු නිරවුල් කර ගැනීමෙන් පසුව මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගැනීමට හැකි බව.	වත්කම් අපේක්ෂිත අරමුණ සඳහා කාර්යක්ෂමව උපයෝජනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.2 ශීර්ෂය 705 - ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික හා පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය
මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා මාර්ග බලපත්‍රය අලුත් කර නොගත් බස් රථ 77 කින් රු. 6,195,065 ක බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	උපයා නොමැති ආදායම ලෙස දක්වා ඇත්තේ දැනට ධාවනය නොවන බස්රථ 77 කට අදාළ අලුත් නොකරන ලද මාර්ග බලපත්‍ර බවත් මාර්ග බලපත්‍රයක් ලබාදෙනුයේ වාර්ෂිකව ගාස්තු ගෙවා අලුත් කිරීමේ පදනම මත බවත් මාර්ග බලපත්‍රය වාර්ෂිකව අලුත් කිරීමේ වගකීම දරනුයේ අදාළ බලපත්‍ර ලාභියා බවත් මෙම කාරණය සම්බන්ධයෙන් 2026/04/06 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී බලපත්‍ර පොත හා ලේඛලය විධිමත් පරිදි භාර දී නොමැති වලංගු කාලය ඉක්මවා මසක් ඇතුලත අලුත් නොකර ඇති මාර්ග බලපත්‍ර අවලංගු කිරීමටත් තීරණය කර ඇති බව.	නියමිත කාලය තුළ බලපත්‍ර අලුත් කරවා ගැනීමටත්, නියමිත කාලය තුළ බලපත්‍ර අලුත් නොකරන ලද මාර්ග බලපත්‍ර අවලංගු කිරීමටත් අවශ්‍ය පියවර ගත යුතුය.

1.5.3 ශීර්ෂය 706 - කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

(අ) කාර්යභාරයන් ඉටුනොකිරීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ජාතික ප්‍රතිපත්ති හා පළාත් ප්‍රතිපත්ති අනුව ධීවර කර්මාන්තය හා විසිතුරු මත්ස්‍ය වගා කර්මාන්තය තුළින් ජාතික හා පළාතේ ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් සකස්කර තිබූ ඌව පළාත් මධ්‍යකාලීන ආංශික තිරසර සංවර්ධන සැලැස්මෙහි (2024 – 2026) 2024 සහ 2025 වර්ෂයන්හි දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ රු. 20,270,000 ක් වටිනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ මිරිදිය ධීවර වැඩසටහනේ මත්ස්‍ය නිෂ්පාදන කටයුතු වලට ප්‍රමුඛතාවය ලබාදීමේදී විගණනයෙන් පෙන්වා දුන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව.	අනුමත සංවර්ධන සැලැස්ම අනුව ක්‍රියාකාරකම් කාලීනව ඉටු කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) වාණිජ අත්තිකාරම් ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ බීජ අර්තාපල් ගිණුමේ හිඟ ණය ශේෂය රු. 7,612,833 ක් වූ අතර වර්ෂ 11 කට අධික කාලයක් පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දක්වා තිබුණු අතර ණය වාරික මාසිකව ක්‍රමාණුකූලව අයවී නොතිබුණි.	ණය අයකර ගැනීමේ කටයුතු සඳහා නිලධාරීන් යොමුකර ඇති බවත් ණය අයවීම් සිදුවෙමින් පවතින බව.	නියමිත කාලය තුළ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.4 ශීර්ෂය 709 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය

(අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2011 පෙබරවාරි 10 දිනැති අංක 2011/1 දරන ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය, 2006 ඔක්තෝබර් 17 දිනැති 1467/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය	නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලයට අයත් ඕහිය පුහුණු මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේදී අදාළ පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබාගැනීම, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ යෝග්‍යතා සහතිකය ලබාගැනීම, පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව ලබාගැනීම සහ ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ පහසුකම් සැලසීම යන නෛතික අවශ්‍යතා සපුරා ගෙන නොතිබුණි.	මෙම ගොඩනැගිල්ල සඳහා NBRO වාර්ථාව සහ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්ථා ලබාගෙන නොමැති අතර, 2026 ජුලි 01 දිනැති ලිපිය මගින් එම වාර්තා ලබාගැනීමට ඉල්ලුම් කර ඇති බවත් ඉදිරියේදී ආබාධිත ප්‍රවේශය සකස් කිරීම් අවශ්‍යතාවය සලකා බලන බව.	ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර අදාළ අනුමැතිය ලබා ගැනීමට සහ ඉදිකිරීම් සැලසුම් කිරීමේදී 1467/15 චක්‍රලේඛයේ අවශ්‍යතාවයන් සම්පූරණ කිරීමට කටයුතු කළ යුතුය .

(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය

(i) පළාත් සභා ආයතනවල කාර්යමණ්ඩල (අධ්‍යාපන හා සෞඛ්‍ය හැර)

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) සේවකයින් 174 ක් අතිරික්ත සේවයේ යොදවාගෙන තිබුණි. ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව 965 ක් විය.	පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට අග්‍රාමාත්‍ය කමිටුවේ අනුමැතිය සඳහා මේ වන විට ඉදිරිපත් කර ඇති බවත්, දීප ව්‍යාප්ත සේවයේ පවතින පුරප්පාඩු පිළිබඳ තොරතුරු අදාළ රේඛීය අමාත්‍යාංශ වෙත යොමු කර ඇති බවත්, ඌව පළාත් සභාව යටතේ පවතින ඌණ කාර්ය මණ්ඩලයේ තනතුරු අතරින් වැඩි	අනුමත කාර්යමණ්ඩලය පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

	ප්‍රමාණයක් ගුරු සේවයට අයත් බවත් එයින් 1606ක ප්‍රමාණයක් බඳවා ගැනීම සඳහා අග්‍රාමාත්‍ය කමිටුවේ අනුමැතිය ලැබී ඇති බවත්, මේ වන විට එකී බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට අදාළව ගැසට්පත්‍ර නිකුත් කර ඇති බව.	

(ii) පාසල් කාර්යමණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසානයට සහායක කාර්ය මණ්ඩලය 1223 ක් සහ වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) සේවකයින් 07 ක් අතිරික්තව සේවයේ යොදවාගෙන තිබුණි. විදුහල්පති සේවයේ තනතුරු 241 ක් සහ ගුරු සේවයේ තනතුරු 2905 ක් පුරප්පාඩුව පැවතුණි.	විදුහල්පති සහ ගුරු සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා අනුමත කාර්යමණ්ඩලය පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුව ඇති බවත් බඳවා ගැනීමේ ක්‍රියාවලියෙන් අනතුරුව පුරප්පාඩු පවතින පාසල් වෙත විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් ස්ථානගත කිරීමට උපදෙස් ලබා දී ඇති බව.	- එම -

(iii) සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ වෙනත් (අනියම්/ තාවකාලික/කොන්ත්‍රාත් පදනම) සේවකයින් 08 ක් අතිරික්තයක් පැවති අතර ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව 572 ක් වූ අතර එම පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	සේවා අවශ්‍යතාව මත ස්ථිර බඳවා ගැනීම් සිදු කරන තෙක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදු කර ඇති බවත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පසු පුරප්පාඩු සම්පූර්ණ කරන බව.	- එම -

(ඇ) ප්‍රසම්පාදනය - සැපයීම් හා සේවා

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලයට අයත් ඔහිය පුහුණු මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (2006) හි 5.4.6 අනුව, මූලික කොන්ත්‍රාත් මුදල ඉක්මවා කරන ලද රු.15,842,404 ක ගෙවීම් වෙනුවෙන් රඳවා තබා ගත යුතු රු.792,120 ක් රඳවා තබා ගැනීමේ මුදල් වශයෙන් අයකරගෙන නොතිබුණි.	කොන්ත්‍රාත් ගිවිසුමෙහි රඳවා තබා ගැනීමේ මුදල සඳහා මූලික කොන්ත්‍රාත් වටිනාකමෙන් 5% ක අයකර ගත යුතු බව සඳහන් ව ඇති බැවින් ඒ අනුව රැඳවුම් මුදල් රඳවා තබා ගැනීමට කටයුතු කර ඇති බව.	විචලනයන් සමඟ ගිවිසුම සංශෝධනය වන බැවින් රැඳවුම් මුදල් තබා ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.5 ශීර්ෂය 710 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

(අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හා ඊට අනුබද්ධිත ආයතන 42 ක, 2017 සිට 2024 දක්වා කාලපරිච්ඡේදය තුළ රු.2,622,000 ක්	වෘත්තීය සමිතිවල බලපෑම හේතුවෙන් ඇඟිලි සළකුණු යන්ත්‍ර පාවිච්චි කරනු නොලබන බව, ඉහළ	චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ

	වැය කර පෞද්ගලික ආයතනයකින් ඇඟිලි සලකුණු යන්ත්‍ර 46 ක් මිලදීගෙන තිබුණ ද, මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හැර ඊට අනුබද්ධිත ආයතන 42 හි ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කර පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දී කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප්, දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප් වශයෙන් රු.මි. 2,363 ක් කාර්ය මණ්ඩලය සඳහා ගෙවා තිබුණි.	කළමනාකරණය සමඟ සාකච්ඡා කර ඉදිරි පියවර තීරණය කරන බව.	යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	සියඹලාණ්ඩුව මූලික රෝහලට අයත් ගිලන් රථයක් 2025 අප්‍රේල් 12 වන දින අනතුරකට පත් වී එක්තරා පෞද්ගලික ආයතනයකින් රු.313,500 ක මුදලක් වැය කර අලුත්වැඩියා කර තිබුණි. අනතුර සිදු වී මාස 09කට වැඩිකාලයක් ගත වී ඇතත් පළාත් මුදල් රීති 104(4) ප්‍රකාරව අවසාන වාර්තාව සකස් කර රක්ෂණභාර අරමුදලෙන් ප්‍රතිපූර්ණය නොකරන ලද රු.110,000 ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අලුත්වැඩියාවන් ද නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණි.	අනතුර සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් පවරා ඇති බවත් අලුත්වැඩියා වියදම රු. 269,500 ක් බවත් ඉන් රු. 203,500 ක රක්ෂණයක් ගෙවා ඇති බවත් රක්ෂණයෙන් ආවරණය නොවන මුදල රක්ෂණ වාර්තාව අනුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කිරීමට කටයුතු කරන බව.	පිළිතුර පිළිගත නොහැක. පළාත් මුදල් රීති අනුව කටයුතු කර අලාභයට වගකිවයුතු පාර්ශවයන් ගෙන් අයකළ යුතුය.

(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

(i)	බදුල්ල ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ ස්වස්ථ පද්ධතිය තුළ 2025 සැප්තැම්බර් 02 දින වන විට පැවති අක්‍රිය ගබඩා 05 ක රු. 71,318,323 ක ඖෂධ තොග ශේෂයක් දැක්වුවද, එම තොගය වෛද්‍ය සැපයුම් ඒකකය තුළ භෞතිකව නොතිබුණු අතර අක්‍රිය ගබඩා දෙකක, විගණිත දිනයේදී භෞතිකව තොග ශේෂයක් නිරීක්ෂණය නොවුනද පද්ධතිය මගින් "Order" සහ "Distribution" ලෙස රු.56,978,393ක් වටිනා ඖෂධ නිකුත් කර තිබුණු අතර එම ඖෂධ රෝහල් සහ ගබඩා මගින් ලබාගෙන නොතිබුණ බැවින් එම තොගවල භෞතික පැවැත්ම විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය.	පෙර පැවති පද්ධතියෙන් දත්ත හුවමාරු කිරීමේදී සැකසුනු ගබඩාවක් බවත්, ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ආයතනයේ මෙම ගැටළු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති බව.	කඩිනම් පරීක්ෂණ නිමකර විගණනයට වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	බදුල්ල ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ සක්‍රිය ගබඩාවල ස්වස්ථ පද්ධතිය තුළින් ඖෂධ ලබාගැනීමට විවිධ රෝහල් මගින් බදුල්ල ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයට ලබාදී ඇති ඇණවුම් සඳහා පද්ධතිය මගින් තොග නිකුත් කර	අදාළ STV පත් මේ වන විට ආයතන මගින් භාරගෙන ඇති බවත් මෙම කටයුතු සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති බව.	මනා සම්බන්ධීකරණයක් හා අධීක්ෂණයක් සහිතව තොග

තිබුණ ද රු. 30,697,312 ක් වටිනා තොග 2025 සැප්තැම්බර් 02 වන දින විටත් රෝහල්වලට ලද බවට පද්ධතිය මගින් සටහන් කර නොතිබීම හා ස්වස්ථ පද්ධතිය තුළින් ඇණවුම් ලැබීමකින් තොරව, ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශය විසින් රෝහල් වෙත පද්ධතිය මගින් ලබාදුන් (Distribution) රු.29,924,707 ක් වටිනා ඖෂධ තොග 2025 සැප්තැම්බර් 02 වන දින විටත් අදාළ රෝහල්වලට ලද බවට රෝහල් පද්ධතිය මගින් සනාථ නොකිරීම හේතුවෙන් එම තොගවල භෞතික පැවැත්ම සත්‍යාපනය කළ නොහැකි විය.		පාලනය සඳහා කටයුතු කළ යුතු අතර පරීක්ෂණ කඩිනමින් නිමකර විගණනයට වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.

(ඈ) දෘෂ්‍ය අක්‍රමිකතා

මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ඉඟිනියාගල ප්‍රාදේශීය රෝහල් ඉඩමේ අක්කර 02 ක පමණ බිම් කොටසක් විධිමත් අනුමැතියකින් තොරව ආයතන භාර වෛද්‍ය නිලධාරි විසින් කොන්දේසි 06 ක ලිපියක් අත්සන් කර 2023 සැප්තැම්බර් 01 සිට බාහිර පුද්ගලයෙකුට බදු දී තිබුණි.	මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර ඉදිරියේදී වාර්තා කරන බව.	පරීක්ෂණ කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.

(ඉ) හඳුනා ගන්නා ලද පාඩු

බිබිල මූලික රෝහලේ ගිණුම් අංක 3970600219 දරන විදුලි මනුවට අදාළව 2023 දෙසැම්බර් මාසයේ ගෙවිය යුතු විදුලි ගාස්තුව වන රු.මි 1.8ක බිල්පතට අදාළ ගෙවීම් හෙද නිලධාරීන් නවාතැන් ගෙන සිටින, නිවාසයේ ගිණුම් අංක 396675508 ට බැර කිරීම හේතුවෙන් හා බිල්පත් ගෙවීම ප්‍රමාද කිරීම නිසා 2023 ජුලි 31 දින සිට 2025 ජුනි 30 දක්වා කාලපරිච්ඡේදයට අදාළව ගෙවන ලද රු.406,067 ක ප්‍රමාද ගාස්තුව ආපසු ලබා ගැනීමට හෝ වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	විදුලිබල මණ්ඩලයට දැන් වූ පසු ඔවුන් විසින් අයකරන ලද ප්‍රමාද ගාස්තු ඉවත් කිරීම සඳහා දැනට පියවර ගනිමින් සිටින බවත් විදුලිබල මණ්ඩලයෙන් ලැබෙන ප්‍රතිචාර අනුව කටයුතු කරන බව.	ගිණුම් නිවැරදිව හඳුනාගෙන ගෙවීම් සිදුකළ යුතු අතර අධි ගෙවීම් සම්බන්ධයෙන් මුදල් රීති අනුව කටයුතු කළ යුතුය.

(ඊ) ආර්ථික නොවූ ගණුදෙනු

කොස්ලන්ද දිසා රෝහලේ භූමිය වටා කම්බි වැට සැකසීමේදී, කොස්ලන්ද - වැල්ලවාය ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති කොටසේ තාප්පයක් ඉදිකර තිබියදී, එම තාප්පය ඉදිරියෙන් නැවත කම්බි වැටක් ඉදිකිරීම සඳහා රු. 392,812 ක ඵලදායී නොවන වියදමක් දරා තිබුණි.	ආරක්ෂිත බැම්මට ඉදිරිපස කොටස් බාහිර පාර්ශවයන් විසින් වෙනත් කටයුතු සඳහා යොදාගැනීම වැළැක්වීම සඳහා වැට ඉදිකර ඇති බව.	විමර්ශනයක් සිදුකර එහි නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.

(උ) නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

(i)	බණ්ඩාරවෙල දිසා රෝහලේ නව ශල්‍යාගාරය වෙනුවෙන් 2024 ජුනි 25 දින මිලදී ගෙන සවිකර ඇති රු. 5,143,000 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 09 ක් 2025 සැප්තැම්බර් 02 දින වන විටත් මාස 15 කට වඩා වැඩි කාලයක් භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. මෙම උපකරණ සඳහා ලබාදී තිබුණු වසර 03 ක වගකීම් කාලයෙන් වසරක් පමණ අවසන් වී තිබුණි.	විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් රෝහල් ශල්‍යාගාරය පරීක්ෂා කිරීමෙන් අනතුරුව එහි සිදු කළ යුතු වෙනස්කම් පිළිබඳව නිර්දේශ අනුව එහි නවීකරණ කටයුතු ආරම්භ කර ඇති බවත් නවීකරණ කටයුතු අවසන්වීමෙන් පසු භාවිතයට ගැනීමට හැකි වන බව.	වත්කම් නිශ්කාර්යව නොතැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ (PSSP) ප්‍රතිපාදන යටතේ පස්සර දිසා රෝහලේ බාහිර රෝගී අංශ ජාලගත කිරීම සඳහා 2019 වර්ෂය තුළ රු. 2,701,875 ක වියදමක් දරා තිබුණු අතර 2025 ඔක්තෝබර් 14 දින වන විටත් බාහිර රෝගී අංශය ජාලගත කිරීමට කටයුතු කර නොතිබුණි. ජාලගත කිරීමට අදාළ උපාංග සවිකිරීම වෙනුවෙන් දරන ලද රු. 1,002,500 ක වියදම ද නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. එසේම, පස්සර දිසා රෝහලෙහි රු. 755,455 ක් වටිනා උපකරණ, බණ්ඩාරවෙල රෝහලෙහි රු. 1,431,450 ක් වටිනා උපකරණ සහ ගිරාදුරුකෝට්ටේ රෝහලෙහි රු. 1,406,750 ක් වටිනා උපකරණ වශයෙන් රු. 3,593,655 ක් වටිනා ජාලගත කිරීමේ උපකරණ නිශ්කාර්යව පැවතුණි.	ජාලගත කිරීමට අවශ්‍ය මෘදුකාංග පද්ධතිය නොලැබීම හේතුවෙන් මෙම උපකරණ නිශ්කාර්යව පවතින බව.	අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වත්කම් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	චීන රජයේ පරිත්‍යාගයක් ලෙස ලැබී 2022 ඔක්තෝබර් 28 දින ගිරාදුරුකෝට්ටේ වකුගඩු රෝග නිවාරණ හා පර්යේෂණ රෝහල වෙත ලබා දී තිබුණු වෙළඳපල වටිනාකම රු. 8,500,000 ක් පමණ වන ජංගම රසායනාගාර බස් රථය 2025 නොවැම්බර් 14 වන විටත් ඌව පළාතේ වකුගඩු රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා යොදා නොගෙන වසර 03 ක් පමණ නිශ්කාර්යව තබා ආපසු අමාත්‍යාංශය වෙත යවා තිබුණි. බස් රථය හා එහි ඇතුළත් රසායනාගාර උපකරණ භාවිතය සම්බන්ධයෙන් චීන රජය මගින් නිලධාරීන් තිදෙනෙකුට පුහුණුවීම් ද ලබාදී තිබියදී, ඔවුන්ගේ සේවය ලබාගෙන නොතිබුණි.	රටේ පැවති ආර්ථික අර්බුධය හේතුවෙන් සහ රසායනාගාර කාර්මික නිලධාරීන්ගේ ඌණතාවය හේතුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකි වූ බවත් මේ වන විට රේඛීය අමාත්‍යාංශයට භාරදී ඇති බව.	ලැබෙන පරිත්‍යාග නිසි ලෙස උපයෝජනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට කටයුතු කළ යුතුය.
(iv)	බණ්ඩාරවෙල දිසා රෝහල් පරිශ්‍රයෙහි රු.1,934,076 ක් වැය කරමින් ජල පෙරණ පද්ධතියක් ස්ථාපනය කර තිබුණද 2025 ජුලි 22 දින වන විටත් මෙම ජල පෙරණ පද්ධතියට අවශ්‍ය ජල සැපයුම සම්බන්ධ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබුණු අතර	බණ්ඩාරවෙල මූලික රෝහලේ ජල පෙරණ පද්ධතියට ජල සැපයුම් ලබාදීමට මෙම වර්ෂයේ මුදල් වෙන්කර ඇති බවත් එම ජල පෙරණ පද්ධතිය භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීමෙන් පසු ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර

	රු. 1,273,000 ක් වැයකර 2023 දෙසැම්බර් 22 වන දින ගිරාඳුරුකෝට්ටේ රෝහලේ ස්ථාපනය කරන ලද ජල පෙරණ පද්ධතිය භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.	ගිරාඳුරුකෝට්ටේ රෝහලේ ජල පෙරණය තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් භාවිතා නොකළ බවත් එය විසඳීමට අදාළ ආයතනය දැනුවත් කර ඇති බව.	වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

(ඌ) ප්‍රසම්පාදනය - සැපයීම් හා සේවා

(i)	බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් සෞඛ්‍ය ආයතනවල නාමපුවරු 51 ක් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදනයේදී, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදයට අනුකූල ලෙස මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කරගෙන නොතිබූ අතර 8.9.1 ඡේදයට අනුකූල ලෙස විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.	සමස්ත පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොමැති බවට පිළිගන්නා බවත් එක් නාම පුවරුවක් සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර එය අනෙකුත් නාම පුවරු සඳහා භාවිත කර ඇති බවත්. මේ කටයුතු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය.
(ii)	2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා රෝහල්වල අමු/පිසූ ආහාර ලබාදීමට පිරිවිතර සකස් කිරීමට ප්‍රාදේශීය මිල ගණන් නියමිත ක්‍රමවේදයට ලබාගෙන නොතිබූ අතර, ලංසු ලියවිල්ලෙහි 18 වන වගන්තිය ප්‍රකාරව ලංසු පිරිනැමීමෙන් පසු ලංසුකරුට අන් අයෙකුට පැවරීම හෝ අතුරු බදු දීම සිදු නොකළ යුතු වුවත්, ඇතිමලේ, තණමල්විල හා හිඟුරුකඩුව ප්‍රාදේශීය රෝහල්වල කොන්ත්‍රාත්තු වෙනත් පාර්ශවයන්ට පවරා තිබුණි.	ප්‍රාදේශීය මිලගණන් පදනම් කර ගනිමින් අමු/පිසූ ආහාර ලබාදීමට පිරිවිතර හා ඇස්තමේන්තු සකස් කරන බවත් ගිවිසුම් ගතවූ සැපයුම්කරුවන් විසින් අතුරුබදු දීම් සිදුකර තිබේද යන්න සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට කමිටුවක් පත්කර ඇති බව.	ප්‍රසම්පාදන සහ ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කළ යුතුය.

1.5.6 ශීර්ෂය 711 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2018 ජුලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය (II) ඡේදය	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 06/2018 දරන 2018 ජුලි 24 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය පදනම් කරගෙන 2024 වර්ෂයේ දී රු. 2,189,269 ක දීමනා ගෙවා තිබුණි.	ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කළ අංක 06/2018 දරන 2018.07.24 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ ඇතුළත් උපදෙස් හා සීමාවන්ට යටත්ව කටයුතු කර ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය.

(ii)	2010 අප්‍රේල් 23 දිනැති අංක 2010/16 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 02 ඡේදය	නිසි ප්‍රමිතියකින් හා ගුණාත්මක බවින් යුතු ප්‍රශ්න පත්‍ර පාසල් මට්ටමින් සකස් කිරීම සඳහා ක්‍රමවත් වැඩසටහනක් පාසල් මට්ටමින් ක්‍රියාත්මක නොකර බදුල්ල දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 06 කට අයත් පාසල් 274 ක් පෞද්ගලික ආයතන විසින් සකස් කරන ලද රු. 13,235,644 ක් වටිනා ප්‍රශ්න පත්‍ර මිල දී ගෙන තිබුණි.	මෙම තත්ත්වයන් ඉදිරියේදී සිදු නොකරන ලෙසට උපදෙස් ලබා දී ඇති බව සහ ගුරු උපදේශකවරුන්, විෂය ප්‍රවීණයන් ගෙන් යුත් කමිටුවක් පත් කර අදාළ කොට්ඨාසයට අදාළ ප්‍රශ්න පත්‍ර සකස් කර, ඌව පළාත් සභා මුද්‍රණාලයෙන් මුද්‍රණය කර ගැනීමට වැඩපිළිවෙලක් සකස් කරමින් පවතින බව.	- එම -

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

(i)	2020/2024 කාල පරිච්ඡේදය තුළ බිබිල, තණමල්විල හා වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලවලට අයත් පාසල් 144කට පාසල් පාදක ඉගෙනුම් බල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පාසල් සංවර්ධන සමිතිවලට බැරකර තිබූ රු. 38,019,969 ක මුදලින් පාසල් 06 ක රු.2,309,174 ක් නිශ්කාර්යව පැවති අතර පාසල් 16 ක රු. 3,088,461 ක් අනුමත වැඩසටහන්වලින් බැහැරව වියදම් කර තිබුණි.	නිශ්කාර්යයව මුදල් රඳවා ගෙන පැවැති මුදල් කඩිනමින් අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යොදවන ලෙස දැනුවත් කිරීමට කටයුතු කර බව දැලිස වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අත්පොත් ආදිය පාසලින් බාහිරව ඡායා පිටපත් ගැනීමේදී විශාල මුදලක් වැය වන හෙයින් පාසලෙහි ඇති ඡායා පිටපත් යන්ත්‍රය භාවිත කර සිදුකර ගැනීමට ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමට කටයුතු කර ඇති බව.	අදාළ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි ප්‍රතිපාදන වැය කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (GEMP) මූලික පරමාර්ථය වන සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමවේදයේ ගුණාත්මක බව ඉහළ නැංවීමට හා ඉගෙනුම් බලගැන්වීම සඳහා ණය ගිවිසුමෙහි විය පැහැදම් සබැඳි දර්ශකය (DLI) මගින් විස්තර කර තිබුණු අරමුණු අතර ඉංග්‍රීසි හා ගණිත ඉගෙනුම් ප්‍රතිඵල වැඩිදියුණු කිරීම ප්‍රධාන අරමුණු දෙක වී තිබුණ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ගත වූ වසර 05 ක කාල පරිච්ඡේදය තුළ බදුල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය කලාප 06 කට අදාළව තෝරාගත් 271 ක් වූ පාසල් නියදිය තුළ පාසල් 37 ක අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි සහ ගණිතය විෂයන්හි සමත් ප්‍රතිශතයෙහි අඛණ්ඩ පසුබෑමක් නිරීක්ෂණය විය.	ඉංග්‍රීසි හා ගණිත විෂයයන්හි ප්‍රතිඵල ඉහළ නංවා ගැනීම සඳහා කටයුතු කරන ලෙස අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව.	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) දෘෂ්‍ය අක්‍රමිකතා

(i)	2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1 ඡේදයට පටහැනිව බදුල්ල අධ්‍යාපන කලාපයට අයත් පාසල් සංවර්ධන සමිතිය වෙත ලබා දී තිබුණු එකතුව රු. 3,546,084 ක් වූ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු 03 ක් බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්මික නිලධාරී විසින් සිදුකර තිබුණි. මෙම කර්මාන්ත වෙනුවෙන් පාසල් සංවර්ධන සමිති මගින් ගෙවීම්	විමර්ශනයක් සිදුකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් එම විමර්ශන වාර්තාවේ සඳහන් නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	විමර්ශන කඩිනමින් නිමකර එහි නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.

	සිදුකළ වවුචර් වල නම් සඳහන් ආයතන වෙත අදාළ චෙක්පත් ලැබී නොතිබුණු බවත් එම කර්මාන්ත වලට අදාළ රු.3,131,885 ක් වටිනා චෙක්පත් 09 ක් ඉදිකිරීම් අධීක්ෂණය කළ තාක්ෂණ නිලධාරියාගේ සහ ඔහුගේ ලිපිනයෙහිම පදිංචිව සිටින චෙක්රෝල් වල වඩු සහ පෙදරේරු ලෙස නම් සඳහන් වෙනත් ව්‍යාපාරිකයකුගේ බැංකු ගිණුම් වලට බැර වී තිබුණි.		
(ii)	විවිධ ව්‍යාපෘති යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ පාසල් 03 ක ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තු පාසල් සංවර්ධන සමිතිය මගින් ඉටුකරන බව හඟවමින් ව්‍යාජ ලිපි ලේඛන සකස් කර රු.1,107,676 ක අයථා මුදල් පරිහරණයක් සිදු වී තිබුණි.	පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ඉදිරි තීරණ ගන්නා බව.	විමර්ශන නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.
(iii)	බ/වේවැල්හින්න විද්‍යාලයේ 80'x20' ගොඩනැගිල්ල අළුත්වැඩියාවට අදාළව 2024 දෙසැම්බර් 26 දිනැති අංක 24/12/02 දරන වවුචරය මගින් රු.234,000 ක මුදලක් පෞද්ගලික ලී වෙළඳසැලක් වෙත ගෙවා තිබුණ ද, එම වවුචරයේ හා චෙක්පත් භාරගැනීමේ ලේඛනයේ ව්‍යාජ මුද්‍රාවක් හා අත්සනක් තබා අදාළ චෙක්පත් ලබාගෙන තිබුණු බවත් අදාළ මුදල පෞද්ගලික ලී වෙළඳසැල්හිමියා විසින් ලබාගෙන නොමැති බවත් තහවුරු විය.	විමර්ශනයක් සිදුකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් එම විමර්ශන වාර්තාවේ සඳහන් නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	විමර්ශන කඩිනම් කර එහි නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	**කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**		
	බ/උඩවෙල මධ්‍ය මහා විද්‍යාලයේ මෙත්තා ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා 2025 සැප්තැම්බර් 22 දින උඩවෙල ග්‍රාම සංවර්ධන සමිතිය හා බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ අධ්‍යක්ෂ අතර රු.1,969,023 ක ඇස්තමේන්තු මුදලකට ගිවිසුම් ගත වී තිබුණු අතර සමිතිය විසින් මෙම ගොඩනැගිල්ල අළුත්වැඩියාවට අදාළ කොන්ත්‍රාත්තුව උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. එම ගොඩනැගිල්ල අළුත්වැඩියාවට අදාළ අංක 2.1 හා 3.1 දරන වැඩ විෂයයන් වන පිළිවෙළින් පංති කාමර පිටත කාණුව සහිත කොරිඩෝව කොන්ක්‍රීට් කිරීම හා පංති කාමර ඇතුළත කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 946,545 ක් වූ ඇස්තමේන්තු ප්‍රකාරව බිම කොන්ක්‍රීට් කිරීමේ දී එහි සනකම මිලිමීටර් 75 ක් විය යුතු වුවත් ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී පංති කාමර සඳහා යොදා තිබුණු කොන්ක්‍රීට්වල සනකම මිලිමීටර් 50 ක් බවත්, පිටත කාණුව සහිත කොරිඩෝවේ කොන්ක්‍රීට් වල සනකම මිලිමීටර් 37.5 ක් බවත්, ප්‍රසාරණ මූට්ටු යොදා නොමැති බවත් නිරීක්ෂණය විය.	පරීක්ෂණයක් සිදු කිරිමට උපදෙස් ලබා දී ඇති බව.	පරීක්ෂණයක් කඩිනමින් සිදුකර එහි නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.

(ඉ)	**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - ප්‍රමාද වූ ව්‍යාපෘති**		
	මො/හිඟුරුකඩුව මහ විදුහලට පෞද්ගලික ආයතනයකින් 2019/2021 කාලපරිච්ඡේදවල ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවස්ථා තුනකදී රු.846,832ක් ලබාදී තිබූ අතර, ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා පාසල් සංවර්ධන සමිති අරමුදලෙන් රු.162,887ක්ද ඇතුලත්ව රු.1,009,719ක වියදමක් දරා තිබුණි. 2021 දෙසැම්බර් මාසයේ ව්‍යාපෘති මූලික වැඩ කටයුතු අවසන් කර තිබුණද, ජලය සපයා ගැනීමේ ගැටළුවක් හේතුවෙන් 2025 ඔක්තෝබර් 16 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.	පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ඉදිරි තීරණ ගන්නා බව.	ඉදිරි ව්‍යාපෘති කාර්යන් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් කිරීමටත්, පවත්නා ගැටළුව විසඳීම සඳහා විකල්ප ඇගයීම් කඩිනමින් සිදු කිරීමත් කළ යුතුය.
(ඊ)	**කාර්ය මණ්ඩල පරිපාලනය**		
(i)	වැලිමඩ අධ්‍යාපන කලාප කාර්යාලය සහ කොට්ඨාස කාර්යාල 02 ක් සඳහා අනුමත කළමනාකරණ සහකාර තනතුරු සංඛ්‍යාව 30 ක් වුවද 2025 සැප්තැම්බර් 22 දිනට කළමනාකරණ සහකාර නිලධාරීන් 37 ක් සේවයෙහි යොදවා තිබීම හේතුවෙන් කළමනාකරණ සහකාර නිලධාරීන් 07 දෙනෙකුගේ අතිරික්තයක් නිරීක්ෂණය වූ අතර එම අතිරික්ත කාර්යය මණ්ඩලය පවත්වාගන යාම වෙනුවෙන් 2024 ජනවාරි 01 දින සිට 2025 අගෝස්තු 31 දක්වා රු.8,121,797 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.	වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලියේ දී අදාළ නිලධාරීන් ස්ථානමාරු කිරීමට කටයුතු කර ඇති බව.	අතිරික්ත කාර්යමණ්ඩල තත්ත්වයන් ඇති නොවන පරිදි කලාප කාර්යාල අතර කාර්ය මණ්ඩල තුලනයක් පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. .
(ii)	බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි අධ්‍යාපන කලාප 03 කට අයත් පාසල් 217 ක ගුරුවරු 1050 දෙනෙකුගේ ඌනතාවයක් ද පාසල් 82 ක ගුරුවරු 212 දෙනෙකුගේ අතිරික්තයක් ද පවතින අතර එම අධ්‍යාපන කලාප වල නගරය ආශ්‍රිත පාසල්වලට අනුමත ගුරුවරු සංඛ්‍යාව ඉක්මවා ගුරුවරුන් අනුයුක්ත කර තිබීම හේතුවෙන් නගරය ආශ්‍රිත පාසල්වල ගුරු අතිරික්තතාවක් හටගෙන තිබුණි. නගරය ආශ්‍රිත පාසල්වල ගුරු අතිරික්තයක් පවතින පසුබිමක් තුළ විධිමත් ගුරු තුලනයක් තුළින් එම අතිරික්ත ගුරුවරු ඌනතා පවතින පාසල් වෙත ස්ථාන මාරුකර හෝ සේවයේ යෙදවීමට කටයුතු නොකර අතිරික්ත ගුරු කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යමින් ඔවුන්ගෙන් 199 දෙනෙකු වෙනුවෙන් එම අධ්‍යාපන කලාප විගණනය කළ දිනට වැටුප් වශයෙන් රු. 97,516,803 ක් ගෙවා තිබුණි.	ස්ථානමාරු ක්‍රියාවලියේ දී මෙම අතිරික්ත සහ ඌනතාවය තුලනය කර ගැනීමට කටයුතු කරන බව.	සුදුසු පරිදි ගුරු තුලනය සිදුකිරීමට කටයුතු කළ යුතුය.

(iii)	බදුල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 03 කට අයත් පාසල්වල අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා විදුහල්පති සේවයේ නිලධාරීන් 88 දෙනෙකු සේවයේ යොදවා 2024 ජනවාරි 01 දින සිට 2025 සැප්තැම්බර් 30 දින දක්වා රු.133,842,443 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. එහෙත් එම අධ්‍යාපන කලාප 03 හි පාසල් 106 ක විදුහල්පති සේවයේ නිලධාරීන් 106 කුගේ පුරප්පාඩු පැවති අතර, ඒ සඳහා ගුරු සේවයේ නිලධාරීන් 83 දෙනෙකු සේවයේ යොදවා 2025 සැප්තැම්බර් 30 දින දක්වා බණ්ඩාරවෙල සහ පස්සර අධ්‍යාපන කලාප 02 හි ගුරුභවතුන් 35 දෙනෙකු වෙනුවෙන් රු.4,767,600 ක් විදුහල්පති දීමනා වශයෙන් ගෙවා තිබුණි. විධිමත් පරිදි විදුහල්පති සේවයේ නිලධාරීන් තුලනය නොකිරීම හේතුවෙන් ඉහත තත්වය උද්ගත වී තිබුණි.	විදුහල්පතිවරුන් ස්ථානමාරු කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ඌව පළාත තුළ ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ස්ථානමාරු සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පවතින බවත්, විදුහල්පතිවරුන් බඳවා ගැනීමෙන් අනතුරුව පුරප්පාඩු පවතින පාසල් වෙත යොමු කිරීමට කටයුතු කරන බවත් වැඩ බලන විදුහල්පතිවරුන් පත් කිරීමට කටයුතු නොකරන බව.	සුදුසු පරිදි නිලධාරීන් පාසල් අතර තුලනය වන ලෙස කටයුතු කළ යුතුය.
(iv)	බදුල්ල දිස්ත්‍රික්කයෙහි අධ්‍යාපන කලාප 02 කට අයත් පාසල් 07 ක් සඳහා රසායනාගාර නොමැතිව රසායනාගාර සේවකයින් 07 දෙනෙකු සේවයේ යොදවා 2024 ජනවාරි 01 දින සිට 2025 සැප්තැම්බර් 30 දින දක්වා රු. 4,598,568 ක් ද පාසල් 02 ක එක් රසායනාගාරයක් පමණක් තිබිය දී රසායනාගාර සේවකයින් දෙදෙනකු බැගින් සේවයේ යොදවාගෙන අතිරික්ත සේවකයින් දෙදෙනෙකුට රු. 2,024,636 ක් ද වැටුප් වශයෙන් ගෙවා තිබුණි.	පාසල්හි සේවය කරන අනධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථානමාරු කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මෙවැනි ගැටළුකාරී තත්ත්වයන් හටගෙන ඇති බවත්, ස්ථානමාරු ප්‍රතිපත්තියක් සකස් කළ පසු ඔවුන් නියමිත පරිදි ස්ථානගත කිරීමට කටයුතු කරන බව.	සේවා අවශ්‍යතාවය අනුව නිලධාරීන් සේවයේ යෙදවීමට කටයුතු කළ යුතුය.
(v)	බදුල්ල දිස්ත්‍රික්කයෙහි අධ්‍යාපන කලාප 02 කට අයත් පාසල් 14 ක් සඳහා පුස්තකාල නොමැතිව පුස්තකාල සේවකයින් 14 දෙනෙකු සේවය යොදවා 2024 ජනවාරි 01 දින සිට 2025 සැප්තැම්බර් 30 දින දක්වා රු. 8,583,832 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.	පාසල්හි සේවය කරන අනධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථානමාරු කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මෙවැනි ගැටළුකාරී තත්ත්වයන් හටගෙන ඇති බවත්, ස්ථානමාරු ප්‍රතිපත්තියක් සකස් කළ පසු ඔවුන් නියමිත පරිදි ස්ථානගත කිරීමට කටයුතු කරන බව	- එම -
(vi)	බ/දියතලාව මධ්‍ය මහා විද්‍යාලයේ 2025 ජනවාරි 01 දින සිට 2025 ජූලි 31 දින දක්වා අතිරික්ත ගුරුවරුන් 17 දෙනෙකු සඳහා රු. 11,531,405 ක් ද 2025 ජනවාරි 01 දින සිට 2025 ජූලි 31 දින දක්වා අතිරික්ත නියෝජ්‍ය විදුහල්පතිවරු 06 දෙනෙකු සඳහා වැටුප් හා දීමනා ලෙස රු. 10,114,017 ක් ද ගෙවා තිබුණි.	වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලියේ දී ගුරු ඌනතාවයන් පවතින පාසල් වෙත අතිරික්ත ගුරුවරුන් ස්ථානමාරු කිරීමට කටයුතු කර ඇති බවත්, විදුහල්පති පුරප්පාඩු පවතින පාසල් වෙත නියෝජ්‍ය විදුහල්පතිවරුන් ස්ථානගත කිරීමට කටයුතු කරන බව.	නිලධාරීන් සුදුසු පරිදි තුලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(vii)	බ/දියතලාව මධ්‍ය මහා විද්‍යාලයේ ගුරුවරු 11 දෙනෙකු සතියකට කාලච්ඡේද 20 කට අඩුවෙන් ඉගැන්වීම් කටයුතුවල නිරතවන බව අනාවරණය වූ අතර, ස්ථානමාරු වීමට පාසලෙන් නිදහස් කළ බව දක්වමින් ගුරුවරු දෙදෙනෙකු සඳහා මාස 06 ක්	ගුරුවරුන් ඌන උපයෝජනයක් නොවන පරිදි අතිරේක රාජකාරි කටයුතු හා වගකීම් පවරා සේවයේ යොදවා ගැනීමටත් වෛද්‍ය නිර්දේශයන් මත අසනීප නිවාඩු ලබා ගැනීම හේතුවෙන් ඉගැන්වීම් කාලසටහන	සේවයේ යොදවා ඇති ගුරුවරුන්ගෙන් නියමිත කාලපරිච්ඡේද

සහ වසරක පමණ කාලයක සිට කාල සටහන් ලබා දී නොතිබුණි.	ලබාදීම් මගින් ළමුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බලපෑමක් සිදුවිය හැකි බැවින් එක් ගුරුමහත්මියක් සහ අනුයුක්තව සිටින අනෙකුත් ගුරුවරිය වෙත කාලසටහන් ලබා නොදී පුස්තකාල කටයුතු, සහන කාලච්ඡේද ආවරණය, නාට්‍ය හා රංගකලාව පුහුණු කිරීම් කටයුතු වැනි බාහිර කටයුතු පවරා ඇති බව.	ප්‍රමාණය ආවරණය වන පරිදි කාල සටහන් ලබාදීමට කටයුතු කළ යුතුය.

1.5.7 ශීර්ෂය 712 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

(අ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය - හිඟ ආදායම්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන වලට ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 708,742,329 ක් අයකර ගෙන නොතිබුණි.	අදාළ හිඟ වරිපනම් හා අනෙකුත් ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන දැණුවත් කිරීමට කටයුතු කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කර අදාළ හිඟ අයකර ගැනිමට කටයුතු කරන බව.	පනත්වල විධිවිධාන අනුව කටයුතු කර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 129(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතන වලට අයවිය යුතු උසාවි දඩ රු. 172,741,560 ක් හා මුද්දර ගාස්තු රු. 401,422,249 ක් පළාත් පාලන ආයතනවලට ලැබී නොතිබුණි.	ආපසු හැරවීමේ ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව ඉල්ලීම් නොකරන ලද මුද්දර ගාස්තු නැවත නිදහස් කිරීමක් සිදු නොකරන බව.	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් පාලන ආයතනවල බලතල අඩුකළ නොහැකි බැවින් අදාළ මුදල් යැවීමට කටයුතු කළ යුතුය.

(ආ) නිකුත් කර තිබුණු අධිභාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරීන්ට හා නියෝජිතයින්ට සිද්ධි 04 ක් වෙනුවෙන් පනවා තිබුණු අධිභාර වෙනුවෙන් රු. 4,081,641 ක් අයවිය යුතුව තිබුණි.	අයවිය යුතු එක් එක් අධිභාර වෙන්වෙන් අදහස් ඉදිරිපත් කර තිබූ බව.	කඩිනමින් අධිභාර අයකිරීමට කටයුතු කළ යුතුය.

1.5.8 ශීර්ෂය 714 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

(අ) ද්‍රව්‍ය අක්‍රමිකතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ලෝක බැංකු ආධාර යටතේ කොවිඩ් 19 හදිසි තත්ත්වය මත මොනරාගල දිස්ත්‍රික්කයේ රු. මිලියන 16.5 වියදමක් දරා ඉදිකර තිබූ ගබඩා දෙකක් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් 2025 සැප්තැම්බර් 06 දින ඌව පළාත් සභාවට පවරා තිබුණි. මින් බිබිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ පිහිටි ධාරිතාවය 50MT යුක්ත ගබඩාව, ගොවි සංවිධානයක සාමාජිකයකු වෙත විධිමත් පටිපාටියෙන් බැහැරව, ගාස්තු අය කිරීමකින් තොරව සහ ගිවිසුමක් නොමැතිව 2024 ඔක්තෝබර් 02 දින ලබාදී තිබූ අතර, විවිධ වර්ගයේ බීජ වර්ග ගොවීන්ගෙන් මිලදී ගෙන ලාභාන්තිකයක් තබාගෙන විකිණීම සිදුකර තිබුණි.	බීජ ගබඩාව නිශ්කාර්ය වත්කමක් ලෙස පැවතීම වළක්වාලීම සහ අදාළ ගබඩාව ප්‍රදේශය තුළ ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් ගබඩාව බීජ නිශ්පාදන සමිතිය වෙත තාවකාලිකව පවරා තිබූ බවත් මේ වන විට විධිමත් ගිවිසුමක් මගින් ගබඩාව භාවිතය සඳහා බීජ නිෂ්පාදකයන්ගේ සංගමය වෙත පවරා දී ඇති බවත් ගිවිසුම අනුව පසුගිය මහ කන්නයේ මුදල් ගෙවා ඇති බව.	ගබඩා විධිමත් ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ) වත්කම් කළමනාකරණය

නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
කොවිඩ් - 19 හදිසි තත්ත්වය තුළ ලෝක බැංකු ආධාර යටතේ ලද ප්‍රතිපාදන වලින් රු. 35,307,661 ක් වැය කරමින් 2023 වර්ෂයේ දී බිඳුණුවැව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ සහ බොරලන්ද සත්ත්ව ගොවිපළෙහි ඉදිකර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලද ඇණු බීජ ගබඩා 02 ක්, බීජ අර්තාපල් ගබඩාවක් සහ අතිරේක ආහාර බෝග බීජ ගබඩාවක් ඉදිකිරීම සිදුකර වසර 03 කට ආසන්න කාලයක් ගතවී තිබුණ ද එම ගොඩනැගිලි ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණුවලට යොදවා නොගෙන නිශ්කාර්යව පැවතුණි.	2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘති සඳහා මෙම ගබඩාවන් භාවිතයට ගැනීමට කටයුතු කරන බව.	වත්කම් නිශ්කාර්යව නොතැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.9 ශීර්ෂය 715 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

(අ) වත්කම් කළමනාකරණය - නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
බොරලන්ද සත්ත්ව ගොවිපළ පරිශ්‍රයේ නළ ළිදක් ඉදිකිරීම සඳහා 2024 දෙසැම්බර් 17 දිනැතිව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත රු.771,366 ක් ගෙවා තිබුණ ද 2026 ජනවාරි 29 දිනවන විටත් එම ළිඳ භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ඉදිකිරීම් සිදු කිරීමට පෙර එහි ප්‍රවේශ මාර්ගය සකසා දෙන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දන්වා සිටින ලද බවත් ඒ අනුව මාර්ගය සැකසීමෙන් අනතුරුව අදාළ කර්මාන්තයේ ඉදිකිරීම් වැඩ කටයුතු ආරම්භ කරන ලද බවත් පවතින ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ අවශ්‍ය කටයුතු සිදු කෙරෙන අතර කඩිනමින් අවශ්‍ය ඉදිරි කටයුතු සම්පාදනය සිදු කරන බව.	අපේක්ෂිත අරමුණු සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය.

(ආ) ප්‍රසම්පාදනය - සැපයීම් හා සේවා

බොරලන්ද සත්ත්ව ගොවිපළ තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘතිය සඳහා රු.1,877,144 ක් වටිනා 7KVA diesel වර්ගයේ ජෙනරේටර් යන්ත්‍රයක් පෞද්ගලික සමාගමකින් ඇණවුම්කර තිබුණු ද 2026 පෙබරවාරි 05 දින වන විටත් එම ජෙනරේටරය සත්ත්ව ගොවිපළට ලැබී නොතිබුණි. ජෙනරේටරය සැපයීම සම්බන්ධයෙන් අදාළ සමාගම විසින් පෞද්ගලික වාණිජ බැංකුවකින් ඉදිරිපත් කර තිබුණු රු.159,080 ක කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය 2025 මාර්තු 31 දිනෙන් අවසන් වී තිබුණ ද එම කාර්යසාධන සුරක්ෂණ මුදල් කර ගෙන නොතිබුණි.	විදුලිය සපයා ගැනීමේ ප්‍රමාදයත් ඒ හා බැඳුණු පළමුව මිලදී ගත් ජෙනරේටරය පරීක්ෂා කිරීමට ප්‍රමාදවීම සමඟ එහි ගෙවීම් ප්‍රමාදවීමත් නිසා දෙවන ජෙනරේටරය අපේක්ෂිත කාලය තුළදී ලබා දීමට එකඟතාවය පලකළ නමුත් එය අනපේක්ෂිත ලෙස ලබා නොදීමත් මෙම ගැටළු සඳහා හේතු වූ බව.	ගිවිසුම් අනුව කටයුතු කිරීමට අවධානය යොමු කළ යුතුය.

1.5.10 ශීර්ෂය 721 - ආයුර්වේද දෙපාර්තමේන්තුව

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - ප්‍රමාද වූ ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2024 වර්ෂයේ ප්‍රතිපාදන මත ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා ගබඩා කළමනාකරණ හා සංඛ්‍යා ලේඛන තොරතුරු දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා රු. 1,890,000 ක ප්‍රතිපාදන වෙන්කර 2024 හා 2025 වර්ෂවලදී රු. 1,134,000 ක් ගෙවා තිබුණි. මෙම කාර්ය	ප්‍රායෝගිකව පද්ධතියේ කටයුතු සිදු කිරීමේදී ගැටළු රාශියක් ඇති වී ඇති බැවින්, තොරතුරු තාක්ෂණ ඒකකයේ පූර්ණ තාක්ෂණික වාර්තාව ලැබීමෙන් පසු ඉදිරි වැඩ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බවත් පවතින අඩුපාඩු නිවැරදි කර	නියමිත කාලය තුළ කාර්ය ඉටුකර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු

	ඉවුකිරීම සඳහා අදාළ ආයතනය වෙත 2024 දෙසැම්බර් 04 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර ඒ අනුව 2024 දෙසැම්බර් 30 දිනට පෙර අදාළ මෘදුකාංගය සංවර්ධන කටයුතු අවසන් කළයුතු වුවද 2025 නොවැම්බර් 07 දින වන විට ද එම කාර්යය නිමකර නොතිබුණි.	ගැනීමෙන් පසුව දෙපාර්තමේන්තු අවශ්‍යතාවයට අනුව පද්ධතියේ ක්‍රියාකාරීත්වය නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කිරීමට පළාත් ආයුර්වේද කෙමසාරිස්ට දන්වා ඇති බව.	කළ යුතුය.

1.5.11 ශීර්ෂය 736 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් - අයවිය යුතු ණය ශේෂ

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
	ඌව පළාත් සභාවේ ආයතන 05 කට අදාළ රු. 1,160,621 ක ණයගැති ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ණය ශේෂයන් ක්‍රමිකව නිරවුල් කිරීමට කටයුතු කරන බව.	සියළු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ

(i)	ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ කාර්යාල 07 ක් වෙත ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ රු. 33,752,233 ක් වූ ණය ශේෂ නිරවුල් කර නොතිබුණි.	- එම -	- එම -
(ii)	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 05 කට අදාළ රු. 5,769,710 ක ණයහිමි ශේෂයක් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	- එම -	- එම -

(ඇ) ප්‍රසම්පාදනය - සැපයීම් හා සේවා

(i)	ඌව පළාත් සභාව සහ පෞද්ගලික සමාගමක් අතර ගිවිසුම්ගතව ක්‍රියාත්මක වන සූර්යබල පද්ධති ව්‍යාපෘතියට අදාළ ගිවිසුමේ 6(xvi) ඡේදය අනුව ගිවිසුම්ගත දිනයේ සිට මාස 12 ක කාලයක් තුළ මෙගාවොට් 46.35 ක ධාරිතාවයෙන් යුතු සූර්ය පැනල සවිකර අවසන් කළයුතු වුවද, 2025 දෙසැම්බර් 31 දින වන විට ගිවිසුම්ගත වහලවල් 879 න් 480 ක පමණක් සූර්ය පැනල සවිකර තිබුණි. වසර 04 ක කාලයක් ඉක්මවා තිබුණ ද ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණි.	ව්‍යාපෘතිය සඳහා වසරක කාලයකට ගිවිසුම් ගත වුවද එම වකවානුවේ රටේ පැවති කොවිඩ් වසන්ගතය හා ආර්ථික අර්බුදය මත අදාළ කාලසීමාව තුළ ව්‍යාපෘතියේ කටයුතු ඉටු කිරීමට නොහැකිවීම මත ගිවිසුම් කාලය දීර්ග කර ඇති බවත් ලැයිස්තුවේ සඳහන් ගොඩනැගිලි වහල ඒකක 608 නිෂ්කාශන ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දී නැති බවත් නිෂ්කාශන ලබා ගැනීමේ ගැටළුව මත අදාළ ඒකක සඳහා සූරිය පැනල සවි කිරීමට නොහැකි වූ බව.	ගිවිසුමට අනුව කටයුතු කළ යුතුය.

(ii)	ඌව පළාත් සභාව යටතේ පිහිටුවා ඇති අරමුදල් සම්බන්ධව නියැදි පරීක්ෂාවේදී අරමුදල් 03 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන් රු. 4,056,300 ක් උපයෝජනය කර තිබුණු අතර එය අරමුදල් 03 සතු වර්ෂය තුළ පැවති වටිනාකමෙන් සියයට 6 ක් පමණ වූ අඩු ප්‍රතිශතයක් විය. මෙම අරමුදල් පිහිටුවා ඇති අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 60,432,549 ක ස්ථාවර තැන්පතු සහ මුදල් ශේෂයක් අරමුදල් තුළ රඳවාගෙන පැවති බව නිරීක්ෂණය විය.	අරමුදල් උපයෝජනය සඳහා කටයුතු කරන බව.	අදාළ අරමුණු අනුව කටයුතු කළ යුතුය.

1.5.12 ශීර්ෂය 738 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය	ඌව පළාත් ප්‍රධාන ලේකම් නිල නිවසේ 2017 සැප්තැම්බර් සිට 2025 ඔක්තෝබර් දක්වා විදුලිය සහ ජල බිල්පත් වෙනුවෙන් රු. 1,080,150 කු ද 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා Peo TV (Silver) සම්බන්ධතාවය වෙනුවෙන් රු. 37,746 ක් ද ඌව පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි.	පළාත් සභා අමාත්‍යාංශයෙන් ලිඛිතව විමසීමට කටයුතු කර ඇති බව සහ එම විමසීම සඳහා පිළිතුරු ලැබුණු පසු මෙම බිල්පත් ගෙවීම සම්බන්ධයෙන් කමිටුවක් මගින් තීරණයක් ගෙන එම තීරණය ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර, එතුමාගේ අනුමැතිය මත මෙම ගෙවීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය.